# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝගස්ථානය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. වෘත්තීය චිකිත්සක තනතුර (POST OF OCCUPATIONAL THERAPIST)**

**සුදුසුකම් :**

I. **වන නිර්ණායකය :** අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් වෘත්තීය චිකිත්සාව පිළිබඳ උපාධියක් ලබා තිබීම. සහ

ආ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන මාස හයක (6) මූලික හැඳින්වීම සහ සම්බන්ධීකරණ (Orientation and Co-Ordination) පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

**සටහන :** විදේශීය විශ්වවිද්‍යාලයකින් උපාධිය ලබා ඇති අයෙකු නම්, වෘත්තීය චිකිත්සකයෙකු ලෙස සේවය කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (Medical Council of Sri Lanka) ලියාපදිංචි වී තිබිය යුතුය.

**හෝ**

II. **වන නිර්ණායකය :** අ. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව සහ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් (1) වරකදී හෝ වාර දෙකකදී (2) විෂයයන් හයකින් (6) සමත් වී තිබීම

**සහ**

ආ. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) භෞතික විද්‍යාව (Physics) සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව සහ සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, ජීව විද්‍යාව හෝ කෘෂිකර්ම විද්‍යාව යන විෂයයන් ඇතුළත් අනෙකුත් විෂයයන් දෙකක් (2) ඇතුළුව විෂයයන් තුනකින් (3) සමත් වී තිබීම

**සහ**

ඇ. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන වෘත්තීය චිකිත්සාව පිළිබඳ වසර දෙකක (2) පූර්ණ කාලීන (අභ්‍යන්තර) ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම.

**වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : MT 06 ශ්‍රේණිය III රු. 72,960/- - 10 X 1080/- - 83,760/- මසකට.

**02. අක්ෂි තාක්ෂණවේදී (OPHTHALMIC TECHNOLOGIST) තනතුර**

**සුදුසුකම්** : අවම ඇතුළත් වීමේ සුදුසුකම්

- අක්ෂි විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය - B.Sc (Optometry) හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අක්ෂි තාක්ෂණ විද්‍යාලය මගින් පිරිනමනු ලබන අක්ෂි තාක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව ලබා තිබීම.
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචිය ලබා තිබීම.
- වසරක (01) පළපුරුද්ද සහිත විය යුතුය.

**වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : MT 06 ශ්‍රේණිය III රු. 72,960/- - 10 X 1,080/- - 83,760/- මසකට.

**පොදු කොන්දේසි**

**සේවා නියුක්ති කොන්දේසි :**

1. ස්ථිර සහ අර්ථසාධක අරමුදල් පදනම මත වේ.
2. රාජ්‍ය අංශයේ ගෙවනු ලබන දීමනාවලට අමතරව, පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද අතිරේක දීමනා ද ගෙවනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්, සෘජු පිටපතක් සමග තමන් සේවය කරන දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් සිය අයදුම්පත් එවිය යුතු අතර, තේරී පත්වුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවට අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

ඕනෑම අයදුම්කරුවෙකු තනතුර සඳහා පත් කිරීම හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝගස්ථානයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් සිය සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව (CV) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් ද සහිතව සිය අයදුම්පත් 2026 ජනවාරි 05 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝගස්ථානය,**
**තලපත්පිටිය, නුගේගොඩ,**
**2025.12.21**